# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 31 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 07/01/2024 පැය 0700

**මාධ්‍ය නිවේදනය**

**කොළඹ - අවිස්සාවේල්ල මාර්ගයේ ජල නල එළීමට වැල්ලම්පිටිය පාලමට සමාන්තර ලෙස යකඩ පාලමක් ස්ථාපනය කිරීම සඳහා රථ වාහන ගමනාගමනය සීමා කිරීම - වැල්ලම්පිටිය පොලිස් වසම.**

කොළඹ නගරය සඳහා ජල සැපයුම සිදු කරන ඉපැරණි ජල නල පද්ධතියේ ඇති වන දෝෂ හේතුවෙන් නව ජලනල පද්ධතියක් කඩිනමින් සකස් කල යුතුව ඇති බැවින් වැල්ලම්පිටිය පොලිස් වසමේ කොළඹ අවිස්සාවේල්ල මාර්ගයේ (පරණ පාර) වැල්ලම්පිටිය මංසන්දියට ආසන්නව පිහිටි පාලම (3/1) සමාන්තර වශයෙන් ජලනල එළීමේ කාර්ය සඳහා යකඩ පාලමක් ස්ථාපිත කිරීමට නියමිතව ඇත.

ඒ සඳහා වැල්ලම්පිටිය මංසන්දියේ සිට කොටිකාවත්ත මංසන්දිය දක්වා වූ මාර්ග කොටස 2024.01.06 වන දින රාත්‍රී 10.00 සිට 2024.01.07 වන දින සවස 5.00 දක්වා කාලය තුල රථ වාහන ගමනා ගමනය සීමා කිරීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලයේ ව්‍යපෘති අධ්‍යක්ෂවරයා විසින් ඉල්ලීමක් කර ඇත.

ඒ අනුව ඉහත කාල සීමාව තුල එම මාර්ගය භාවිතා කිරීමට අපේක්ෂිත රියදුරන්ට හා මහජනතාවට පහත විකල්ප මාර්ග භාවිතා කරන ලෙසට පොලිසිය ඉල්ලා සිටී.

**විකල්ප මාර්ග:-**

- අවිස්සාවේල්ල දෙස සිට කොළඹ දෙසට ධාවනය වන රථ වාහන කොටිකාවත්ත හන්දියෙන් වමට හැරී ගොතටුව නගරයෙන් කොළොන්නාව හරහා දෙමටගොඩ දෙසින් බේස්ලයින් මාර්ගය හෝ කොලොන්නාව මංසන්දියෙන් නැවත අවිස්සාවේල්ල මාර්ගයට පිවිසිය හැක.

- කොළඹ දෙස සිට අවිස්සාවේල්ල දෙසට ධාවනය වන රථ වාහන ඔරුගොඩවත්ත අවිස්සාවේල්ල මාර්ගයෙන් වැල්ලම්පිටිය පොලිස් ස්ථානය ඉදිරිපිටින් දකුණට හැරී කොළොන්නාව හරහා ගොතටුව නගරයෙන් වමට හැරී කොටිකාවත්ත මංසන්දියෙන් නැවත අවිස්සාවේල්ල මාර්ගයට පිවිසිය හැක.